## දස වැදෑරුම් දූක්ම

# 2010 ස්ත්‍රීන්ගේ මැතිවරණ ප්‍රකාශනය

# Women’s Political Menifesto -Sri Lanka




- දේශපාලන බලය සහ සම අයිතිය
- ස්ත්‍රීන්ගේ මූලික අයිතිවාසිකම්
- ලිංගික හිංසනය සහ ප්‍රචණ්ඩත්වය
- ස්ත්‍රී ශ්‍රමයේ අභිමානය
- නව ජනමාධ්‍ය ධර්මතාවයක අභියෝගය
- ස්ත්‍රි සංවේදි ආපද සහ පුනරුත්තාපන ක්‍රියාදමය
- ජනතා සේවය

2010 **ස්ත්‍රීන්ගේ මැතිවරණ ප්‍රකාශනය**

## පූර්විකාව

යටත් විජිත යුගයේ පටන් ශ්‍රී ලංකාවේ ස්ත්‍රීන්ගේ ජීවිතවල වැදගත් වෙනස්කම් සිදුවූ බව අපි දනිමු. අධ්‍යාපනය,සෞඛ්‍යය,නීති ප්‍රතිසංස්කරණ,ආර්ථිකය සහ සමාජ තත්වයන් වැඩි දියුණු කිරීම සහ සමාජයේ බොහෝ දෙනා අතර ස්ත්‍රී පුරුෂ සමාජභාවය ගැන දැනුවත්කම වර්ධනය යන අංශවල  යම් ප්‍රගතියක් අත්දැක ඇත. ස්ත්‍රීන්ගෙන් 90% ක් සාක්ෂරතාවය ලබා ඇත. වෙන කවරදකටත් වඩා දැන් ඔවුහු ප්‍රසිද්ධ මහජන ක්ෂේත්‍රයට පැමිණ සිටිති. ස්ත්‍රියක් රාජ්‍ය නායිකාවක වශයෙන් ප්‍රථම වරට පත් වූයේ ද ශ්‍රී ලංකාවේය.

1981 වසරේදී එක්සත් ජාතීන්ගේ කාන්තා සම්මුතියට ශ්‍රී ලංකාව අත්සන් තබන ලදී. 1993 වසරේදී කාන්තා ප්‍රඥප්තියක් ප්‍රකාශයට පත් කෙරිණ. එසේම ස්ත්‍රීන් ගේ අභිවෘර්ධිය , සුභ සාධනය සහ අයිතිවාසිකම් වලට අදල රාජ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීමට අමාත්‍යාංශයක්ද පිහිටුවා ඇත. වැඩ සැලසුම් සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම ජාතික කාන්තා කමිටුව සහ කාන්තා කාර්යාංශය හරහා සිදුවේ.

කෙසේ වෙතත් දශක තිහක් පුරා අප අත්දුටු යුධ ගැටුම් ද , සුනාමිය සහ ගංවතුර වැනි ආපද වලදී ද  ආර්ථික අර්බුද ඉස්මතු වන අවස්ථා වලදී ද උග්‍ර වන දරිද්‍රතාව හමුවේ ද විපතට පත්වූ ජනගහනයෙන් අති බහුතරය ස්ත්‍රීන් විය. මීට අමතරව ස්ත්‍රීහු නොයෙක් ආකාරයේ ආර්ථික සූරාකෑම් වලට ,  දේශපාලන බැහැර කිරීම් , නෛතික වෙනස්කම් කිරීම් සහ සමාජ පීඩනයන්ට තවමත් ගොදුරු වෙති. එපමණක් නොව ස්ත්‍රීන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය , පීතෘආධිපත්‍යධාරී භාවිතයන් සහ ස්ත්‍රීන් පිලිබඳ සාම්ප්‍රදායික ආකල්ප තුරන් කිරීමට අප අසමත්ව ඇත. දිනෙන් දින වර්ධනය වන දේශපාලන ප්‍රචණ්ඩත්වය හේතු කොට ශ්‍රී ලාංකික ස්ත්‍රිය දේශපාලන නායකත්වයට පැමිණීමට වැටකඩුළු බැඳී ඇත. දකුණු ආසියාවේ අනික් රටවල් හා සංසන්දනය කරන විට දේශපාලනයේ සහ තීන්දු ගන්නා ආයතන වල ස්ත්‍රී සහභාගිත්වය සහ නියෝජනය ඉතා පහල මට්ටමක පවතියි.

ස්ත්‍රීන්ගේ සම අයිතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුල නෛතිකව සහතික කර තිබුණද හරයාත්මකව සම අවස්ථා සහ සම අවකාශ භුක්ති විඳීමට ඇයට නොහැකිව ඇත. පුරුෂ කේන්ද්‍රී ප්‍රතිපත්ති සැකසීමත් ස්ත්‍රී අසංවේදී  සංස්කෘතික හා සාම්ප්‍රදායික පැවැත්මත් ලාංකීය ස්ත්‍රියගේ අභිමානය සහ සමානාත්මතාවය අකාමකා දමා ඇත. ඇය නිරන්තරයෙන්ම දේශයේ බලයේ සහ සම්පත් වල සම උරුමකරුවන් නොව හුදෙක්ම සම්මාදම් යදින්නියක් බවට පත් කර ඇත.

මේ වන විට වර්ධනය වන සාම්ප්‍රදායික ආකල්ප රටාව අපගේ සමානාත්මතාවය සඳහා විශාල බාධාවන් පමුණුවන බව පෙනේ. එසේම මෙතෙක් දිනාගත් අයිතීන් ද මේ නිසාම වැලළී යන තත්වයකට පත්ව ඇත.  දේශපාලන තලයේ පරිවර්තනයක් ගෙන එන්නේ මැතිවරණයන් හරහාය. පත්වන පාර්ලිමේන්තුව නව නීතී රීති සකස් කරන්නේ මැතිවරණ ප්‍රකාශයන් පදනම් කරගනිමිනි. එහෙයින් මෙම ස්ත්‍රී මැතිවරණ ප්‍රකාශය අප එළි දක්වනේ ස්ත්‍රීන්ගේ සමාජ , දේශපාලන සහ ආර්ථික තත්වයන් සම්බන්ධයෙන් නව කථිකාවක් සමාජගත කිරීමටය. දේශපාලන අභියෝගයක් බවට පරිවර්තනය කිරීමටය.  ජනගහණයෙන් හරි අඩකටත් වැඩි ස්ත්‍රීන්ගේ සම උරුමය සහ සමානාත්මතාවය සහතික කිරීම ප්‍රජාතන්තවාදය සහ මානව හිමිකම් ගරු කිරීමක් පමනක් නොව යහපාලනයේ ප්‍රධාන  අංගයක් ද විය යුතුය.

## දේශපාලන බලය සහ සම අයිතිය

1931 සර්ව ජන ඡන්ද බලය ලැබුනු දිනයේ පටන් දේශපාලනයේ තීන්දු තීරණ ගනු ලබන සියළු ආයතන වලට ස්ත්‍රීන් පත්ව ඇත්තේ 4% ක අඩු නියෝජනයක් පමණි.  පලාත්පාලන ආයතන වල ස්ත්‍රී නියෝජනය 2%  ඉක්මවීමට නොහැකිව ඇත. දේශපාලනයේ ඇති පුරුෂාධිපත්‍යයික රටාව සහ මතවාදය අපි අත්දැක ඇත්තෙමු. එසේම මැතිවරණ ක්‍රියාදාමය තුල මැරබලය , මුදල් බලය සහ ආධිපත්‍යවාදය රජ කිරීමත් සමගම ස්ත්‍රීන්ට එම ක්ෂේත්‍රයට පිවිසීම තවත් අසීරු කරන ලදි.  දේශපාලනයේ දී ඇය දේශපාලන සැමියා හෝ සහකරුවා වෙනුවෙන් කුටුම්භය ආරක්ෂා කරන්නිය බවට පත්වී ඇති අතර, සැබෑ දේශපාලන නායිකාවක වශයෙන් ඉදිරියට පැමිණීම  අධෛර්‍යමත් කර ඇත.

මෙම සියළු සමාජ දේශපාලන හා ආර්ථික කරුණු සැලකිල්ලට ගනිමින් දේශපාලන ක්ෂේත්‍රයේ ද පරිපාලනයේ ද වෙනස්කම් සිදු විය යුතුය. සියළු මණ්ඩල වල ස්ත්‍රී නියෝජනය 30% දක්වා වර්ධනය කිරීමට අදාළ නීති ක්‍රියාත්මක කිරීමට අපි යෝජනා කරමු.  ඒ හරහා ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ සහ පොදු රාජ්‍ය මණ්ඩල එකඟතාවයන් සාක්ෂාත් කිරීමට උරදිය යුතුය.  නව පාර්ලිමේන්තුව ලබා ගන්නා බහුතර බලයෙන් ලාංකික ස්ත්‍රීන්ට ගෞරවයක් හිමි කර දීමට ප්‍රතිඥාවක් දිය යුතුය.

දේශපාලනයේ ස්ත්‍රී නායකත්වය වර්ධනය කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන අදල අමාත්‍යාංශ වලට ලබා දිය යුතුය. ස්ත්‍රී අයිතිවාසිකම් දිනා ගැනීම සහ සවිබල ගැන්වීම සඳහා විශේෂ ව්‍යාපෘති දියත් කල යුතුය. සංවර්ධන ව්‍යාපෘති වැය ශිර්ෂයේ 10% ක් කාන්තා අභිවෘද්ධිය සඳහා වෙන් කළ යුතුය. දියවඩන නිළමේ පත් කිරීම සඳහා පවත්වන ඡන්දයේදි කාන්තා දිස්ත්‍රික්ක ලේකම්වරියන්ට ඡන්ද බලය අහිමි කර ඇත. මේ තත්වය වෙනස් කිරීමට අදල නීති සංශෝධන නව පාර්ලිමෙන්තුවට ගෙනා යුතුය.

## ස්ත්‍රීන්ගේ මූලික අයිතිවාසිකම්

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ස්ත්‍රීන්ට එරෙහි සියළු අකටයුතුකම් සහ දෙවැනි තැනලා සැලකීම් තුරන් විය යුතුය. එසේම 1981 අප විසින් අත්සන් කර ඇති එක්සත් ජාතීන්ගේ සීඩෝ ප්‍රඥප්තියට අනුව සමානාත්මතාවය පිලිගන්නා නෛතික රාමුවක් සකස් විය යුතුය. ලිංගික හිංසනය සහ දූෂණය සම්බන්ධයෙන් යුක්තියක් ලබා ගැනීමට අපට විශාල වෙහෙසක් දැරීමට සිදුවේ. එසේම යඪ ගැටුම් තත්වය තුල ස්ත්‍රීන්ට එරෙහිව සිදුවූ අපරාධයන් සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා නැත. යුද්ධයෙන් විපතට පත් ස්ත්‍රීන්ට නිසි ආරක්ෂාවක් සැපයීම ද , ඇයගේ අවශ්‍යතාවයන් සපුරා ගැනීමට ද නොහැකි වී ඇත. එසේම සමාජයෙන් තනි ගැහැණිය කොන්වේ. වියපත් ස්ත්‍රීන් ද විවිධ සමාජ අකටයුතුකම් වලට මුහුණ දීමට සිදුව ඇත.

ස්ත්‍රීන්ගේ ගෞරවය ආරක්ෂා කිරීම දේශපාලනයේ වගකීම විය යුතුය. ඇය විසින් සිදු කරනු ලබන සමාජ මෙහෙවර අගයමින් ඇයගේ මූලික අයිතිවාසිකම් තහවුරු කළ යුතුය.

දණ්ඩ නීති සංග්‍රහයේ නීති රීති ද යුක්තිය පසිදලීමේ ක්‍රියාදාමය ද ස්ත්‍රී අයිතිවාසිකම් වලට සංවේදී විය යුතුය.

ඇයගේ අයිතිවාසිකම් උල්ලංඝනයට ලක්වන සියළු නීති රීති විමර්ශණයට ලක්විය යුතු අතර, සමානාත්මතාවය තහවුරු කරන ආකාරයට නෛතික සංශෝධනයන් ගෙන ආ යුතුය. පත්වන නව පාර්ලිමේන්තුව මේ සඳහා විද්වතුන්ගෙන් සමන්විත මණ්ඩලයකින් පත් කර ඒ නිර්දේශයන් මහජන කථිකාවකට ගෙන ඒමෙන් සියලු පාර්ශවයන්ගේ සහභාගීත්වය ඇතුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලබා දී ඇති මූලික අයිතිවාසිකම් තහවුරු කළ යුතුය.

විශේෂයෙන්ම රාජ්‍ය ප්‍රතිපත්ති නිසා විපතට පත් ස්ත්‍රීන්ට වන්දි මුදල් ලබා දිය යුතුය. යුද්ධයෙන් විපතට පත් ස්ත්‍රීන්ට විශේෂ සහන ලබාදිය යුතුය. ඒ සඳහා විශේෂ කාර්යාංශයක් ස්ථාපිත කළ යුතුය. කාන්තා හිමිකම් පනත පාර්ලිමේන්තුව තුල සම්මත කරගනිමින් මුළු ලෝකයාටම ආදර්ශයක් දීමට සුදුසු කාලය එළඹ ඇත.

## ලිංගික හිංසනය සහ ප්‍රචණ්ඩත්වය

ස්ත්‍රීන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සහ හිංසනය නව ස්වරූපයන් ගෙන ඇත. යුද්ධ ගැටුම් පැවති රටක් වන ශ්‍රී ලංකාව තුල වර්ධනය වූ හමුදාකරණය නිසාත් , අවි ආයුධ භාවිතයත් හේතු කොට හිංසනය බරපතල වී ඇත. ඉතා දරුණු පහරදීම් වලට ස්ත්‍රීන් ගොදුරුව ඇත. දූෂණය කිරීමෙන් නොනැවතී ස්ත්‍රීන් ඝාතනය කර ඇළ දෙළවල හෝ පාළු ප්‍රදේශවල දමා ගිය අයුරු අප දැක තිබේ. එසේම තරුණියන් ද කුඩා දරුවන් ද ලිංගික අපරාධයන්ට ලක් කිරීම් වල වර්ධනයක් සිදුව ඇත. දේශපාලන ප්‍රචණ්ඩත්වය ද ස්ත්‍රීන් වෙත එල්ල වන අවස්ථා එමටය. විරුද්ධ පාක්ෂික ස්ත්‍රීන්ට පහරදීම , ඔවුන්ගේ නිවෙස් ගිනිබත් කිරීම් ඇතුලු බිය ගැන්වීම් හරහා දේශපාලන මර්ධනය දියත් කෙරේ. අවතැන් කඳවුරු තුල ස්ත්‍රීන් හිංසනයට හා පීඩාවට ලක්ව ඇත. කර්මාන්තශාලා තුල සහ පිටත දී ස්ත්‍රීන්ට විවිධ අතවරයන්ට මුහුණ දීමට සිදුවේ.

ස්ත්‍රී දූෂණය සහ ලිංගික අතවර අපරාධයකි. ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහයට අනුව දඬුවම් ලැබිය යුතු වරදකි. එහෙත් පොලිසියට යාමේදීත් අධිකරණ ක්‍රියාමාර්ගයට පිවිසීමේදීත් ස්ත්‍රීන් විවිධ බාධාවන්ට සහ අසාධාරණයන්ට මුහුණ දෙති. මේ නිසාම නීතියේ පිළිසරණ පැතීමට යාමට ඔවුහු අකමැත්තක් දක්වති.

ලිංගික හිංසනය සහමුලින්ම තුරන් කිරීමට පියවර ගත යුතුය. විශේෂිත නගර සහා තෝරා ගනිමින් මෙම තත්වය සම්පූර්ණයෙන්ම තුරන් කිරීමට අදළව ආදර්ශ ව්‍යාපෘති දියත් කරමින් මහජනතාව අතර පුළුල් අවබෝධයක් ඇති කළ යුතුය.

නීති රීති අර්ථාන්විත ලෙස ක්‍රියාවට නැගීමට පොලීසියේ විශේෂ අවධානය යොමුකළ යුතු අතර,ඒ සඳහා විශේෂ පුහුණුව ලත් ඒකකයක් පිහිටුවිය යුතුය.

යුද්ධයේ අවසාන භාගය තුල සිදුවුනා යැයි කියනු ලබන තත්වයන් පරීක්ෂා කිරීමට ස්වාධීන විද්වත් මණ්ඩලයක් ස්ථාපිත කළ යුතුය. ඒ හරහා ලිංගික හිංසනයන්ට සහ දූෂණයට ලක්වූ ස්ත්‍රීන්ට යුක්තියක් ඉටු කර ගත හැකි පරිසරයක් සකස් කළ යුතුය. සාක්ෂි දීමට හැකි විශ්වාසනීය පරිසරයක් නිර්මාණය කළ යුතුය.

## ස්ත්‍රී ශ්‍රමයේ අභිමානය

ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ මර්මස්ථාන වන ආයෝජන කලාප,වතුකරය,සංක්‍රමණය සහ සේවා සැපයීමේ ක්ෂේත්‍රයේ ශ්‍රම බලකායේ බහුතරය ස්ත්‍රීන්ය. කාර්යාල තුලද කර්මාන්තශාලාවේ ද විදේශ සේවයේ යෙදෙන අවස්ථා වලදී ද ස්ත්‍රීන් විවිධ අකටයුතුකම් වලට මුහුණ දෙති. ලිංගික හිරිහැර වලට ලක් වෙති. ස්ත්‍රී ශ්‍රමයට තවමත් නිසි අගයක් ලැබී නැත. ඇය විසින් ගෘහස්ථව සපයන සේවයට කිසිඳු වටිනාකමක් නොලැබේ. ලංකාවේ ආර්ථිකයට අතිවිශාල දයකත්වයක් සැපයුවද නිසි සේවා පහසුකම් , ප්‍රවාහන සේවාවන් හෝ ආරක්ෂාව ඇති පරිසරයක් ගොඩනැගීමට අප සමත් ව නැත.

මිනිස් බල ( Manpower ) අමාත්‍යාංශය මානව සම්පත් අමාත්‍යාංශය වශයෙන් වෙනස් විය යුතුය.

සංවිධිත වෘත්තීය සමිති ක්ෂේත්‍රයේ ස්ත්‍රී නායකත්වයක් නොමැත. එසේම ස්ත්‍රී අයිතිවාසිකම් සහ අවශ්‍යතාවයන්ට සංවේදී සාමූහික ගිවිසුම් ද නැත.

ජීවන වියදමට සරිලන වැටුපක් ලබා දීම රාජ්‍ය ප්‍රතිපත්තියට ඇතුලත් කළ යුතුය. සම සේවයට සම වැටුප් ලබා දීම අපගේ ආර්ථික දර්ශණයේ පදනම විය යුතුය.

ස්ත්‍රීන් ගේ නිපුණතාවයන් සහ තාක්ෂණික දැනුම වර්ධනය කර ගැනීම සඳහා විශේෂ අවධානයක් යොමු කළ යුතුය.

සංක්‍රමණික සේවයේ යෙදෙන සියළු ශ්‍රී ලාංකිකයන්ට ඡන්දය දීම සඳහා විශේෂ සැලැස්මක් ගොඩ නැගිය යුතුය. එසේම ජාත්‍යන්තර ප්‍රඥප්තීන්ට අනුව ඔවුන්ගේ මානව හිමිකම් සහ සේවා අයිතිවාසිකම් සුරකෙන ගිවිසුම් මත පදනම් වූ සේවා තත්වයන් තහවුරු කළ යුතුය.

## නව ජනමාධ්‍ය ධර්මතාවයක අභියෝගය

ස්ත්‍රීන්ගේ ප්‍රතිරූපයන් නිර්මාණය කිරීම සම්බන්ධයෙන් විශේෂ වගකීමක් ජනමාධ්‍යයට හිමිවේ. මේ වන විට ස්ත්‍රීන් මුහුණ දෙන අභියෝගයන් සම්බන්ධයෙන් සංවාදයක් ගොඩ නැගී නැත. සාම්ප්‍රදයික ස්ත්‍රී චරිත යලි යළිත් නිර්මාණය කරමින් මාධ්‍ය පුරුෂාධිපත්‍යයික වටිනාකම් නව තාක්ෂනික උපාය මාර්ගයන් යොදගනිමින් ප්‍රචලිත කරයි. ස්ත්‍රී රුව සහ ශරීරය වෙළඳ භාණ්ඩයක් බවට පත් වි ඇත.

මාධ්‍යය මර්ධනයේ බලපෑම මත සියළු මාධ්‍ය ආයතන ස්වයංවාරණයක් ක්‍රියාත්මක කරයි. ඒ නිසාම ඇත්ත ඇති සැටියෙන් දැනගැනීමටත් විවේචනාත්මකව කරුණු ඉදිරිපත් කිරීමටත් නොහැකිව ඇත. විශේෂයෙන්ම යුද්ධ ගැටුම් නිසා ස්ත්‍රීන් මුහුණ දෙන ප්‍රතිවිපාකයන් සොයා බලා වාර්තාකරණය කිරීම පූර්ණ වාරණයකට යටත්ව ඇත.

රාජ්‍ය මාධ්‍යය පසුගාමී සාම්ප්‍රදායික පුරුෂාධිපත්‍යයික මතවාදයක් ජන මනසට ඇතුලත් කරන යුගයක එයට විකල්පව අදහස් සහ තොරතුරු ගෙන ඒමට ඉතුරුව ඇත්තේ කුඩා අවකාශයක් පමණි. එහෙයින් ජනතාවට නිදහස් තොරතුරු ලබාගැනීමට ඇති අයිතියට ගරු කරන මාධ්‍ය සම්ප්‍රදායක් බිහි කිරීම හදිසි කරුණක්ව පවතියි.

ස්ත්‍රීන් ගේ මානව අයිතිවාසිකම් වලට ගරු කරන , ඇයගේ අභිමානය සහ සමානාත්මතාවයත් තහවුරු කරන නව ජනමාධ්‍ය සංස්කෘතියක් සඳහා කැපවිය යුතුය. මාධ්‍ය නිදහස තහවුරු කිරීම මේ සඳහා අනිවාර්‍යය වේ.

## ස්ත්‍රී සංවේදි ආපදා සහ පුනරුත්තාපන ක්‍රියාදමය

ගංවතුර නියගය සහ සුනාමිය වැනි ස්වභාවික ආපදාවන් වලදීද යුධ ගැටුම් වලදී අවතැන්වීම , පරිසරය අහිමි වීම, ප්‍රචණ්ඩත්වයට ලක්වීම වැනි විපත් වලින් කාන්තාවන්ට විශාල බලපෑමක් ඇති වන්නේය. මෙවැනි ආපදා වලදී විපතට පත් වන ස්ත්‍රීන් සහ ගැහැණු ළමුන්ගේ මූලික අවශ්‍යතාවයන්ද , අයිතිවාසිකම්ද , සාක්ෂාත් කර ගැනීම සඳහා යොමු වන තත්වයක් අප දුටුවේ නැත. එහෙයින් ආපදා සහ පශ්චාත් ආපදා සහනාධාර කටයුතු ද පුනරුත්තාපන කටයුතුද ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමතුලිතතාවයක් තහවුරු වන ආකාරයට දියත් කල යුතුය.

ඒ සඳහා ජාතික ප්‍රතිපත්තියක් ගොඩනැගීමට පියවර ගත යුතුය. මෙහිදි විශේෂයෙන්ම ස්ත්‍රීන්ගේ ගෘහ මූලිකත්වය ඉඩම් සහ නිවාස ලබා දීමේදී ද වන්දි නිර්ණය කිරීමේදි ද සැලකිල්ලට ගත යුතුය. ඒ සඳහා අදාල පරිදි නීති සංශෝධනයන් ගෙනා යුතුය.

## ජනතා සේවය

විවෘත ආර්ථිකය සහ ගෝලියකරණ ක්‍රියාකාරිත්වය තුල සෞඛ්‍යය , අධ්‍යාපනය සහ සමාජසේවාවන් බරපතල කප්පාදුවකට ලක් වී ඇත. පැවති හැම ආණ්ඩුවක්ම මේ සඳහා වෙන් කරන ලද්දේ සමස්ථ අයවැයෙන් 4% - 5% පමණ ප්‍රමාණයකි. මේ නිසාම මන්ද පෝෂණයද , ණයගැතිභාවයද , ලිංගික ශ්‍රමිකයන්ගේ වැඩි වීමක්ද , ළමා අපයෝජනයද වර්ධනය වී ඇත. එහෙයින් නිරෝගිභාවය සුරකින සහ සමාජ යුක්තිය මත පදනම් වු ජනතා සේවා සැලැස්මක් අපි යෝජනා කරමු. මෙම සැලැස්ම ස්ත්‍රී සහ ළමුන්ගේ අයිවාසිකම් සහ අවශ්‍යතාවයන් හඳුනාගත් වැඩ පිළිවෙලක් විය යුතුය. ජනතාවගේ මූලික අවශ්‍යතාවයන් වන ජලය , සෞඛ්‍යය සහ අධ්‍යාපනය වැනි සේවාවන් ජනතා සේවාවන් වශයෙන් ප්‍රකාශයට පත් කල යුතුය. එසේම එවැනි සේවාවන්ට අදාලව ප්‍රතිපත්ති නිර්මාණය කිරීමේදි ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වු විග්‍රහයක් යොදා ගත යුතුය. සම්පත් බෙදි යාමේදී ද ඊට අදාලව නිර්ණායකයන් හඳුන්වාදිය යුතුය. රටේ ආහාර සුලභතාවය , නිරෝගිභාවය සාක්ශාත් කිරීම , පිරිසිදු ජලය සුලභ කිරීම , දේශීය සම්පත් ජනතාව සඳහා රැක ගැනීම ඉතා අඩු වියදමකින් ක්‍රියාත්මක කල හැකි පසුබිමක් අපේ රට තුල පවතී.

මෙම සේවාවන් අඩු මිලකට ලබා දීම සහතික කිරීම හරහා ගෘහයේ බර උසුලන ස්ත්‍රීන්ගේ කාර්යභාරයන් මනා කළමණාකරනයකට ගෙන ඒමට හැකි පරිසරයක් නිර්මාණය වනු ඇත.

## සම අයිතිය සුරකින සංස්කෘතික දැක්ම

ශ්‍රී ලංකාවේ ස්ත්‍රීන් සම්බන්ධයෙන් වන සමාජ සංවර්ධන දත්තයන් දකුණු ආසියාවේ වෙනත් රටවල් හා සංසන්දනය කරන විට පෙරමුණ ගනී. සාක්ෂරතාවය , මාතෘ හා ධාරක මරණ අනුපාතිකය වැනි දත්තයන් වල විශාල ප්‍රගතියක් අප අත් කර ගෙන ඇත. එහෙත් අම්මා යන වචනයේ පරිසමාප්තයෙන්ම ගෙදර බර උසුලන්නිය ද , කුටුම්භය රැකගන්නියද , ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය විඳදරා ගන්නියද යන මතය නිසාම ඇය ගෙදර සිරකාරිය බවට පත්ව ඇත. සාම්ප්‍රදායික හා සංස්කෘතික ආකල්ප යොද ගනිමින් ස්ත්‍රීන්ට එරෙහි සියළු අකටයුතුකම් සාධාරණය කිරීමට සමාජය හැඩගැන්වී ඇත.

දිළිඳුකම තුරන් කරලීමේ භාරදූර වගකීමේ සිට පුරුෂයාගේ බලය සුරැකීමත් , දරුවන්ගේ අනාගතය ගොඩනැගීමත් ස්ත්‍රීන් පිට මේ වන විට පටවා ඇත. ස්වාධීනව සහ සමානාත්මතාවය තහවුරු වන ආකාරයෙන් පොදු සමාජ සහ දේශපාලන කටයුතු වලට අවතීර්ණ වීමට ඉදිරිපත් වන ස්ත්‍රීන් අපහාසයට සහ උපහාසයට ලක් වේ. මෙය ස්ත්‍රීන්ගේ නායකත්වය ගොඩනගා ගැනීමට විශාල බාධාවකි.

අප පිලිගන්නා කිසිදු ආගමික දර්ශණයක , ප්‍රතිපත්තියක හෝ ඇදහිල්ලක ස්ත්‍රීන්ගේ අයිතිවාසිකම් වලට එරෙහිව කිසිදු ප්‍රකාශයක් කර නොමැත.

එහෙයින් අපගේ ආගමික සංස්කෘතීන්ට අනුවද , ජාත්‍යන්තරව පිලිගත් ප්‍රතිපත්තීන්ට අනුවද ශ්‍රී ලාංකික කාන්තාවන්ගේ සම අයිතිය , සම අවකාශය , සම අවස්ථා සහ සම උරුමය භුක්තිවිඳීමට ඇති සියලු බාධක තුරන් කල යුතුය. අදල පරිදි නෛතික සංශෝධනයන් ඉදිරිපත් විය යුතුය. විවිධ පුද්ගල නීති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් ප්‍රතිපත්ති වලට අනුකූලව සංශෝධනය විය යුතුය. ස්ත්‍රීන්ගේ ජීවිත ආරක්ෂාව තහවුරු විය යුතුය. ස්ත්‍රීන් දෙවැනි තැන ලා සැලකෙන සියළු තත්වයන් සහ මතවාදයන් මුලිනුපුටා දැමීමට මාධ්‍යය හැසිරවීමද , ප්‍රතිපත්ති සකස් කිරීමද රජයේ වගකීම විය යුතුය. ඒ සඳහා සම්පත් ලබා දීමද , විශේෂ ආයතනයක් පිහිටුවීමද අපි යෝජනා කරමු.

## දිළිඳුකම තුරන් කිරීම

පසුගිය දශක කිහිපය තුල ස්ත්‍රීන් දිළිඳුභාවයේ දරුණුතම විපාකයන්ට මුහුණ දී ඇත. අපගේ කලාපය තවමත් ලෝකයේ දිළින්දන් වැඩියෙන්ම සිටින කලාපයයි. ඉන් බහුතරය ස්ත්‍රීන්ය. ශ්‍රී ලංකාවද මේ අතර වේ. ශ්‍රී ලංකාවේ දිළින්දන් අතරින් ස්ත්‍රීන් ඉහල මට්ටමක පැවතීම ගැන අපි විරෝධය පල කරමු. මෙම තත්වය වරින් වර මතුවන මූල්‍ය අර්බුධයන් විසින් තවදුරටත් වර්ධනය කරනු ලබයි. ඒ නිසාම කුට්ඨනය සහ වෙනත් අනාරක්ෂිත සේවා තත්වයන් තුල සිරකරනු ලැබේ. දිළිඳු ගෘහස්ථයන් වල පිරිමින් සහ ස්ත්‍රීන් දිළිඳුභාවය අත්දකින්නේද විෂමතාවයන් අනුවය. දිළිඳුකම තුරන් කරලීමේ ව්‍යාපෘති හරහා ද ඇයට ලැබිය යුතු සම අවකාශ සහ සම අවස්ථා තහවුරු කර නැත. එසේම ස්ත්‍රී පුරුෂ සමාජභාවය යොද ගනිමින් නිර්ණායකයන් ද සකස් වී නැත.

එහෙයින් සමෘද්ධි ව්‍යාපාරය ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වු නිර්ණායකයන් යොද ගනිමින් විමර්ෂණයට ලක්විය යුතුය. එම ව්‍යාපෘතිය ස්ත්‍රීන්ට සම අවස්ථා සහ සම අවකාශ ලබා දීම තහවුරු වන ආකාරයට ප්‍රතිනිර්මාණය විය යුතුය.

එසේම පොලොව සරු කරන ස්වාභාවික කෘෂිකාර්මික නිෂ්පාදන වැඩ පිලිවෙලක් හරහා රටේ ආහාර සුලභතාවය වර්ධනය කල හැකි ක්‍රියාකාරිත්වයකට නායකත්වයක් සැපයීමට ස්ත්‍රීන්ව සවිබල ගැන්විය යුතුයැයි යෝජනා කරමු. මේ හරහාම පරිසර සංවේදි , වස විෂ නොමැති ආහාර නිෂ්පාදනයක්ද , තිරසාර සංවර්ධන ප්‍රතිපත්තියක්ද සකස් කිරීම සඳහා ස්ත්‍රීන්ගේ කෘෂිකාර්මික දැනුම සහ අත්දැකීම් යොද ගැනීමට අපි යෝජනා කරමු.

## ජාතීන් අතර යුක්තිය සහ සමානාත්මතාවය

යුද්ධය පැවති දශක තිහක කාලය පුරා සිංහල, දෙමළ, මුස්ලිම් යන ජනවර්ගයන්ට අයත් ස්ත්‍රීන් විවිධ අභියෝගයන්ට මුහුණ දුන්හ. එහෙත් සාමය සහ සහජීවනය සඳහා වන ක්‍රියාකාරිත්වය තුල සුවිශේෂ නායකත්වයක් දරමින් සාම ක්‍රියාවලිය තුල ද ගැටුම් වැලැක්වීම සම්බන්ධයෙන්ද ශ්‍රී ලාංකික ස්ත්‍රීන් අනුපමේය සේවාවක් ඉටු කර ඇත.

එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය වර්ෂ 2000 දී සම්මත කරන ලද 1325 දරණ යෝජනාවට අනුව සාමය ගොඩනැගීමේ ක්‍රියාකාරිත්වයේ ස්ත්‍රීන් සම පංගුකරුවන් බවට පත් කල යුතු බව ප්‍රකාශ කර ඇත. එසේම සන්නද්ධ ගැටුම් වලදී ස්ත්‍රීන්ගේ ආරක්ෂාව සහතික කළ යුතු යැයි සඳහන් කර ඇත.

ජනවාර්ගික අර්බුදයට දේශපාලන විසඳුමක් අවශ්‍ය බව අපි විශ්වාස කරමු. මෙම ක්‍රියාදමය සාර්ථක කර ගැනීම සඳහා ස්ත්‍රීන්ගේ සක්‍රිය දයකත්වය ලබා ගැනීමට අදලව පරිසරය සකස් විය යුතුය. ප්‍රතිපත්ති නිර්මාණය විය යුතුය. ස්ත්‍රීන්ට අවස්ථා ලබා දිය යුතුය.

- දේශයේ සම්පත් සුරැකීමත් සංවර්ධනය කිරීමටත් අපි ඇප කැප වෙමු.
- දූෂණය,නාස්තිය සහ සම්පත් මංකොල්ලයට අපි එරෙහි වෙමු.
- දේශයේ බලය සහ පාලනය ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරන ආණ්ඩු පාලනයකට කැප කරමු.
- විපතට පත්ව සිටින ධීවරයින්,ගොවි ජනතාව,නාගරික දිළිඳු ජනතාව, කම්කරුවන් හා වතු කම්කරුවන් , අවතැන් වුවන් ඇතුලු ජනතාව සමග ජනගහනයෙන් අඩක් වන ස්ත්‍රීන් සහ මව්වරුන් සංවිධානාත්මක බලයක් ලෙස නායකත්වයක් ගැනීමට පෙරට ගනිමු.
- ඉතිහාසය පුරා සමාජ දේශපාලන වගකීම් දැරීමෙන් බැහැර කරනු ලැබ සිටින ජනගහනයෙන් හරි අඩක් වූ ස්ත්‍රීන් මෙම දේශයේ සම අයිතිය සම අවකාශය සම ඉඩ ප්‍රස්ථා සහ සම උරුමය සුරකින දේශපාලන අනාගතයක් වෙනුවෙන් කැපවෙමු.

**කාන්තා දේශපාලන පීඨය**

**19 1/1 , සිරිධම්ම මාවත, කොළඹ 10**

**දුරකතන ඃ 011 2682505**

**මෙම මැතිවරණයේදී ඔබට විශේෂ පණිවුඩය**

ස්ත්‍රීන්ගේ ඡන්දය - දූයේ ගෞරවය

ලංකාවේ ඡන්දදායකයන් ගෙන් 53% වන බව ඔබ දන්නෙහි ද? ඔවුන් 1931 සිට සර්ව ජන ඡන්ද බලය භුක්ති විඳ ඇති බව ඔබ දන්නෙහි ද?

ශ්‍රී ලංකාව ලෝකයේ ප්‍රථම අගමැතිනිය බිහි කළේය. එහෙත් කාන්තා දේශපාලන සහභාගිත්වය 5% කටත් වඩා අඩු බව ඔබ දන්නෙහිද? ඡන්දය දෙන අවස්ථාවේදී ස්ත්‍රීන් ඉතාමත් උද්යෝගයෙන් ඡන්ද පොළට ගමන් කර සිය කතිරය දේශපාලනඥයන්ට

ලබා දෙති. එහෙත් ස්ත්‍රීන්ගේ ඡන්ද ප්‍රමාණය කොපමණදැයි දැනගැනීමට හැකි වන ආකාරයෙන් සංඛ්‍යා ලේඛන සහ දත්තයන් සකස් කිරීමට ක්‍රමවේදයක් නැත. එසේ වුයේ නම් ලාංකික ස්ත්‍රීන්ගේ ඡන්ද බලයේ අපේක්ෂාවන් කුමක්දැයි අපට දැක ගත හැකි වනු ඇත. එසේම දේශපාලන කතිකාවක් ඒ හරහාම ගොඩනගා ගත හැකිව තිබුණි.

මහා මැතිවරණයකට සූදානම් වන මෙම යුගයේදී අප ස්ත්‍රී මැතිවරණ ප්‍රකාශනයක් ඔබ අතට ලබා දෙන්නේ ඡන්දයේ වැදගත්කම තේරුම් ගැනීමට හැකිවීමටය. මැතිවරණයකින් දේශයේ පාලනයේ ගමන් මග තීන්දු වේ. විශේෂයෙන්ම පලාත් සභා හෝ පලාත් පාලන ආයතන මැතිවරණ මෙන් නොව රටේ ආර්ථිකය ඔබේ දරුවාගේ අධ්‍යාපනය මෙන්ම ස්ත්‍රීන්ගේ අනාගත පැවැත්ම තීරණය වන ආණ්ඩු පාලනය තීන්දු කරන්නේ ඔබය. එහෙයින් ඔබගේ ඡන්දය අපගේ මූලික අවශ්‍යතාවයන් සපුරාලන , මානව හිමිකම් සහ දේශිය සම්පත් සුරකින පාලන තන්ත්‍රයක් බිහිකිරීමට ලබා දීමට ඔබ යොමු වනු ඇත.

එසේම පාර්ලිමේන්තුව මූලිකව ආර්ථික ප්‍රතිපත්ති සහ අදල නීති රීති සම්පාදනය කරනු ලබන දේශපාලන ආයතනයයි. නීති රීති වලට පයින් ගසන හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝණය කරන්නවුන් පාර්ලිමේන්තුවට පත් කිරීමට අපට නොහැක. එසේම මැතිවරණ නීති රීති උල්ලංඝණය කරන මැතිවරණ ව්‍යාපාරයක් අපට අනුමත කළ නොහැක්කේ ඒ හරහා ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ 17 වන සංශෝධනය උල්ලංඝණය වන බැවිනි. එවිට නිර්මාණය වන්නේ නිදහස් සහ සාධාරණ මැතිවරණයක් පැවැත්වීමට නොහැකි තත්වයකි.

ඡන්දදායකයන්ගෙන් හරි අඩක් වන ලාංකීය ස්ත්‍රීන් නිදහස් සහ සාධාරණ මැතිවරණයක් වෙනුවෙන් පෙනී සිටීම වැදගත් යැයි අපි කල්පනා කළෙමු. මන්ද අනාගත කැබිනට් මණ්ඩලය සමන්විත වන්නේ නීති රීති උල්ලංඝණය කළ දේශපාලනඥයන් ගෙන් නම් එය අපේ ඡන්දයට නිග්‍රයක් වනු ඇත.

අපේ දරුවන්ව පාසල් වලට ඇතුලත් කිරීම සඳහා කොතරම් වෙහෙසෙන්නේද?  සමහර අවස්ථාවන් වලදී මූලික අයිතිවාසිකමක් වන පාසලට යාමට දරුවන්ට ඇති අයිතිය දෙමව්පියන්ට මිලදී ගැනීමටද සිදුවන බව අපි දනිමු. මැතිවරණය කදී අප ඡන්දයෙන් මේ තත්වය දිගටම පවතවාගෙන යාම හෝ වෙනස් කිරීම සඳහා තීන්දුවක් ගැනීමට අවකාශය උදකර දේ. එහෙයින් ඔබ සර්වජන ඡන්දයේ අගය සහ බලය තේරුම් ගත යුතුය.

මේ වන විට සමස්ථ අයවැයෙන් ස්ත්‍රීන් වෙනුවෙන් වෙන් කළ අමාත්‍යාංශයට ලැබෙන්නේ සමස්ථ අයවැයෙන් 0.02% පමණි. සෞඛ්‍යය අමාත්‍යාංශය හරහා ලැබෙන්නා වු බෙහෙත් හේත් ද කප්පාදු වී ඇත. සේවාවන් අතිශය දුර්වල වී ඇත. මෙම දශකය පුරාම මෙවැනි පිරිහීමක් අප දකින්නේ හුදෙක්ම යුධ ගැටුම් පැවති නිසා පමණක් නොවේ.

දේශයේ පාලනයේ මතුවී ඇති අර්බුදය සහ පක්ෂග්‍රාහීභාවය පුරවැසියාගේ අයිතීන් පාක්ෂිකයාගේ අයිතිය බවට පත් කර ඇත. මේ හරහා ප්‍රජාතන්ත්‍රවාදය සම්පූර්ණයෙන්ම ගිලිහී ගොස් ඇත. ස්ත්‍රීන්ගේ ප්‍රතිරූප පවා අද ගොඩනැගෙන්නේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කරමිනි. එහෙයින් ඔබගේ වටිනා ඡන්දය ලබා දිය යුත්තේ දේශපාලන ප්‍රචණ්ඩත්වයට එරෙහිවය. නිදහස් සහ සාධාරණ මැතිවරණයක් නිර්මාණය කිරීමට අප කැප වෙන දේශපාලන බලවේගයක් බිහිකිරීමටය. මාධ්‍ය නිදහස සහතික කිරීමටය.

**කාන්තා දේශපාලන පීඨය**

**19 1/1 , සිරිධම්ම මාවත, කොළඹ 10**

**දුරකතන ෑ 011 2682505**